# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2337/16 - 2023 ජූනි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2023.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වන හා 5 වන වගන්ති යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති වැඩබලන අමාත්‍ය ෂෙහාන් සේමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *(I) වන තීරය* | | | | *(II) වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩයේ විස්තරය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1 | 04.08 | | අලුත්, වියලූ, වාෂ්පයෙන් හෝ වතුරෙන් තම්බා පිසින ලද, කැට කළ, හිමායිත හෝ වෙනත් ආකාරයකින් පරිරක්ෂණය කළ, සීනි හෝ වෙනත් රසකාරක අඩංගු කළ හෝ නොකළ, කටුව රහිත කුරුලු බිත්තර සහ බිත්තර කහමද | |
| | | 0408.99 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු.1,300 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් භාණ්ඩවලට අදාළව විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අත්හරිනු ලැබිය යුතු බවට මෙසේ නියමයක් පනවමි;

(i) ඉහත උපලේඛනයේ දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0408.99 යටතේ වර්ගීකරණය වන අධිශීතකළ දියරමය සම්පූර්ණ බිත්තර ආනයනය කිරීමේ දී අදාළ වන කිලෝ ග්‍රෑමයක් සඳහා රු.1,300ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝ ග්‍රෑමයක් සඳහා රු.200ක් අයකර ගෙන ඉතිරි වටිනාකම, අනුමත කළ ප්‍රමාණය හා අදාළ නියමයන් හා රෙගුලාසිවලට යටත්ව, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, අත්හරිනු ලැබිය යුතුය; සහ



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) 2022 ඔක්තෝබර් 13 දිනැති අංක 2301/40 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 03.03 යටතේ වර්ගීකරණය වන මාළු ආනයනය කිරීමේ දී අදාළ වන 10% ක් හෝ කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 400 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, පහත වගුවේ දැක්වෙන සං.ව.සංකේතාංක යටතේ වර්ගීකරණය වන මාළු වර්ග සඳහා කිලෝ ග්‍රෑමයකට රු.275ක් අයකර ගෙන ඉතිරි වටිනාකම, ධීවර අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, අත්හරිනු ලැබිය යුතු ය.

| *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *මාළු වර්ගය* |
|---|---|---|
| 03.03 | 0303.49.00<br>0303.89.90 | තලපත්, කොප්පරා සහ කට්ටා මසුන් |

3. මෙම නියමය, 2023 ජුනි මස 23 වැනි දින සිට ආරම්භවන මාස තුනක (03) කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

**ෂෙහාන් සේමසිංහ,**
*වැ.බ.* මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජුනි මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 06 - 0194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.